44

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 13(1)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018/03/28 |

පැමිණිලිකරු : එස්.එස්. ජයතුංග මයා,
කෙලින් වීදිය,
කොලොන්න.

වගඋත්තරකරුවන් : 01. උ.පො.ප සම්පත් ජයවික්‍රම මයා,
මූලස්ථාන පොලිස් පරීක්ෂක,
රත්නපුර.

02. උ.පො.ප චන්දිම මයා
පොලිස් ස්ථානය,
කොලොන්න.

03. පො.සැ 64210 සේරසිංහ මයා
පොලිස් ස්ථානය,
කොලොන්න.

04. පො.කො 42887 විරවර්ධන මයා
පොලිස් ස්ථානය,
කොලොන්න.

05. පො.කො 50486 චාමින්ද මයා,
පොලිස් ස්ථානය,
කොලොන්න.

පැමිණිලි අංකය : **HRC/1144/12**

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2011.08.07 වන දින කොලොන්න පොලිස් නිලධාරීන් වන චන්දිම සහ සේරසිංහ යන නිලධාරීන් දෙදෙනා තම මවගේ වෙළඳ සැළ වෙත පැමිණ පාරට කුණු දමා ඇති බව පැවසූ බවත්, පසුව තම මව පැමිණ




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැහැදිලි කළද, ඒ කිසිත් නොපිළිගෙන, 01 වන වගඋත්තරකරු ඇතුළු නිලධාරීන් 12 ක් පැමිණ තමා අත්අඩංගුවට ගෙන පොලිසිය වෙත රැගෙන ගිය බවත්, පොලිස් ස්ථානයේදී තමාට පහරදී හිස් කොළයකට අත්සන් ගත් බවත්, පසුව තමා අධිකරණයට ඉදිරිපත් කළ බවත්ය. එහිදී තමාගේ මවගේ වෙළඳසැළෙහි ලාච්චුවේ බෝම්බයක් තිබූ බවට සඳහන් කර තමාට විරුද්ධව චෝදනා ගොනුකර තිබූ බවත් පසුව තමාව මාස 06 කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් දක්වා ඇත.

තමා සම්බන්ධව මෙසේ අත්තෝමතිකව කටයුතු කිරීමට හේතුව 1 වන වගඋත්තරකරු තමා හා පවතින පෞද්ගලික අමනාපයක් බවත් දන්වා ඇති අතර, තමාට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරතිබූ නඩුවට අදාළව "චූදිතට එරෙහිව තවදුරටත් නීති මගින් කටයුතු කිරීමට අදහස් නොකරන" බව දක්වා තමා නිදහස් කළ බවත් සඳහන් කර ඇත.

එසේ වුවද වගඋත්තරකරුවන් විසින් තමාව අත්තෝමතිකව අත්අඩංගුවට ගෙන පහරදී තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවට මෙම පැමිණිල්ල මගින් දන්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

01 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක සම්පත් අබේවික්‍රම

මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු තමා කිසිදු විටක අත්අඩංගුවට ගැනීමට සහභාගී නොවුනු බවත් එසේ වීමට හේතුව තමා 2011.06.26 වන දින සිට 2011.10.02 වන දින දක්වා කලුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ස්ථානාධිපතිවරුන් තනතුරට හැඩ ගැස්වීමේහිලා පවත්වන ලද පාඨමාලාව සඳහා සහභාගී වීම බවද දක්වා ඇත. එහිදී වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කරන ලද්දේ උ.පො.ප බංඩාර මහතා බවට දක්වමින් තමා වැඩ මුලුවට සහභාගි වීම සනාථ කරන ලේඛනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. මෙම පැමිණිලිකරු සම්බන්ධව මීට ප්‍රථම තමා අත්අඩංගුවට ගැනීමකට සහභාගි වූ නමුත් ඔහු පැනදිවීමක් කළ බවත් ඒ සම්බන්ධව දැනට නඩුවක් පවතින බවත් එම සිදුවිම සිදුවූයේ තමාට මතක හැටියට 2012 වර්ෂයේ බවත් මෙම පැමිණිලිකරු සම්බන්ධව මුල් කාලිනව රජයේ අරක්කු බලපත්‍රයක් නොමැතිව විකිණීම සම්බන්ධව අවවාද කළ බවත් දක්වා ඇත.

02 වන වගඋත්තරකරු උ.පො.ප චන්දිම

දැනට තමා පොලිස් සේවයෙන් ඉවත් වී පුහුණු කර්මාන්ත ශාලා කළමණාකරුවෙකු ලෙස කටයුතු කරන බවත් සිද්ධිය වූ දින තමාත් 3, 4 හා 5 යන වගඋත්තරකරුවන් පරිසර නඩු ගැනීම සඳහා ත්‍රිරෝද රථයකින් පිටත්ව ගිය බවත් එහිදී කොලොන්න නව නගරයට ගිය විට පැමිණිලිකරුගේ මෑණියන් විසින් කුණු ඉවතට දමා අතුගාමින් සිටිනු දුටු බවත් ඒ අනුව ත්‍රිරෝද රථය එම ස්ථානයට ගෙන ගිය බවත්, ඇයට ඊට පෙරද අවවාද කර තිබූ නමුත් ඇය ඒ පිළිබඳව කටයුතු නොකළ බැවින් ඇයගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට උත්සහ කිරීමේදි මෙම පැමිණිලිකරු එම කඩයේ සිට ඒ සඳහා විරෝධය පා තමාට තර්ජණය කළ බවත් සඳහන් කර ඇත.

එහිදී ඔහු "උඹලාගේ පොලිසියට බය නැහැ මරණවා" කියා කැෂියර් එක ආසන්නයේ සිට තර්ජණය කළ බවත් ඔහුගේ මැණියන්ට ඒ සඳහා අත්සන් කිරීමට එපා යැයි කියා කියූ බවත් තමාගේ ඇගේ හැපි පැමිණිලිකරු එළියට ගිය බවත්, ඉන්පසුව බෝතලයක් රැගෙන බිම ගැසූ බවත් එම තර්ජණය පිළිබඳ සැකසිති තමා ඔහුව අල්ලා ගැනීමට ලඟට යාමේදී ඔහු පැන දිවූ බවත් සඳහන් කර ඇත. තර්ජණය කිරීම නිසා සැකසිති පරීක්ෂා කිරීමේදී පුපුරණ අත්බෝම්බයක් ලාච්චුවේ තිබුනු බවත් ඔහු දිවයාමේදී ඔහු පිටුපස 4 සහ 5 වගඋත්තරකරුවන් දිවගොස් ඇප්පෙරුව ගඟ ලඟදී අල්ලා ගත් බවත් තමා අත්අඩංගුවට ගත් අත් බෝම්බය පිළිබඳ සේරසිංහ මයාට දන්වා තමාද ඔවුන් පසු පස දිවගිය බවත් කියා සිටින අතර, මැණියන් පිළිබඳ ප්‍රකාශය සම්පූර්ණ නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

03 වන වගඋත්තරකරුගේ කරු පො.සැ 64210 සේරසිංහ

තමා සහ තවත් නිලධාරින් දෙදෙනෙකු සිවිල් ඇඳුමින්ද පළවන වගඋත්තරකරු නිල ඇඳුමින්ද 04 වන වගඋත්තරකරුගේ ත්‍රිරෝද රථයෙන් පරිසර නඩු ලබා ගැනීම සඳහා පිටව ගිය බවත් එහිදී එක් කඩ පලක කාන්තාවක් අතුගාමින් පාරට කුණු එකතු කරනු දුටු බැවින් කඩයට මීටර් 4 ක් හා 5 ක් දුර තිබියදී ත්‍රිරෝද රථය නවතා තමාත් 2 වන වගඋත්තරකරුත් එම ස්ථානයට ගිය බවත් දක්වා ඇත.

එහිදී කඩයේ එක් පුද්ගලයෙක් සිටි බව මතක බවත් කඩය අතුගාමින් සිටි කාන්තාව කළ වරද ඇයට කියාදී තමා කඩය තුළදී ඇයගේ ප්‍රකාශයක් සටහන් කරගත් බවත් එය අත්සන් කිරීමට පැවසූ විට කොමිෂන් සභාවේ පැමිණිලිකරු කෑගැසූ බවත් ඇය විසින් බීම බෝතල් දෙකක් පොලොවේ ගැසූ බවත්, පසුව පැමිණිලිකරුත් බීම බෝතලයක් පොලොවේ ගැසූ බවත් ඉන්පසුව ඔහු කෑගසමින් බැණ දිවගිය බවත් දක්වා ඇත. චන්දිම මහතා ඒ අවස්ථාවේදී තමා සතුව අත්බෝම්බයක් ඇති බව දැන්වූ බවද පසුව ඔහු එම අත්බෝම්බය සමඟ එම සැකකරු පසුපස දිව ගිය බවත් පසුව තමා ටික වේලාවක් එම ස්ථානයේ සිට ත්‍රිරෝද රථය ගෙන යමින් ඔවුන් ගිය මග දිගේ ගිය බවත් දක්වා ඇත. ඊට ප්‍රථම ඔහු ලුහුබදිමින් 3 හා 4 වන වගඋත්තරකරුවන් දිව ගිය බවද දක්වා ඇත.

04 වන වගඋත්තරකරු පො.සැ 42887 විරවර්ධන

උ.පො.ප චන්දිම ඇතුළුව අනෙකුත් නිලධාරින් දෙදෙනෙක් ඇතුළුව තමා පරිසර නඩු ලබා ගැනීම සඳහා ත්‍රිරෝද රථයෙන් යන අතරතුර කඩ පේලිය අසල කාන්තාවක් කඩයෙන් එළියේ අතුගාමින් සිටිනු දුටු බවත් ඒ අනුව 02 වන වගඋත්තරකරු හා 03 වන වගඋත්තරකරු කඩය අසලට ගිය බවත්, තමාත් 04 වන වගඋත්තරකරුත් කඩයට මීටර් 15 ක් දුරින් කඩය පැත්තේ ත්‍රිරෝද රථය නවතා ඒ අසල සිටි බවත් ටික වේලාවකින් කඩය ඇතුළතින් කාල ගෝට්ටියක් ඇසුනු බවත් ඒ පිළිබඳව විමසිලිමත්වීමේදී කඩය තුළින් පුද්ගලයෙකු වේගයෙන් පාර පැන අතුරු පාර දිගේ දිව ගිය බවත්, ඉන්පසුව චන්දිම මහතාගේ දැනුම්දීම අනුව තමාත් ඔහු පසුපස දිවගිය බවත් එසේ දිව යාමේදී ඔහු හා ගඟ අසල විශාල කුඹුක් ගස ලඟදී මෙම පුද්ගලයා අල්ලා ගත් බවත්, එහිදී අල්ලා ගැනීමේදී ඔහුත් තමාත් වැටුනු බවත් පසුව ඔහු අල්ලා ගත් පසු ඉතිරි නිලධාරින් තිදෙනාත් එතනට ආ බවත්, සඳහන් කර ඇත. පසුව චාමින්ද රාළහාමිත් මෙම පුද්ගලයා අල්ලාගන ගිය තිරෝද

රථයේම පොලිස් ස්ථානය වෙත ගෙන ආ බවත් පසුව තමාත් වෛද්‍යවරයා වෙත ඉදිරිපත් වී ප්‍රතිකාර ලබාගත් බවත් කාන්තාවගේ ප්‍රකාශය චන්දිම මයා විසින් කඩය තුළදී ගත් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

05 වන වගඋත්තරකරු පො.කො 50486 චාමින්ද

තමාත් අනෙකුත් නිලධාරිනුත් පාරිසරික නඩු ලබා ගැනීම සඳහා ගිය බවත් එසේ යන අතරතුර කඩපිළ ආසන්නයේ කාන්තාවක් පාර අසල අතුගාමින් කුණු දමමින් සිටිනු දුටු බවත්, ඒ අනුව 02 වන වගඋත්තරකරුගේ දැනුම්දීම අනුව ත්‍රිරෝද රථය කඩයට මදක් ඉදිරියට ගොස් මීටර් 4 ක් 5 ක් ඈතින් නතර කළ බවත්, පසුව කඩය අසලට 02 වන වගඋත්තරකරු සහ 03 වන වගඋත්තරකරු ගිය බවත් තමාත් විරවර්ධන නිලධාරියාත් ත්‍රිරෝද රථය ආසන්නයේ නතර වූ බවත් දක්වා ඇත. ටික වේලාවකින් පසුව 02 වන වගඋත්තරකරුගේ දැනුම්දීම මත එක් පුද්ගලයකු දුවනවා ඔහු අල්ලා ගන්න යැයි පැවසීම අනුව පසුපස දිවගිය බවත් විරවර්ධන රාලහාමි ගගෙන් එගොඩ ගල් හා කුඹුක් මුල් තිබූ ස්ථානයේදී ඔහු අල්ලා ගත් බවත්, දක්වා ඇත. පසුව ඒ ආසන්නයට 02 වන වගඋත්තරකාර චන්දිම මහතා පැමිණි බවත් ඔහු ඒ අවස්ථාවේදී මෙම පැමිණිලිකරු ලඟ තිබූ අත් බෝම්බය පෙන්වූ බවත් පසුව ඔහුව අත්අඩංගුවට ගෙන තමාත් චන්දිම මහතාත් විරවර්ධන නිලධාරියාත් ත්‍රිරෝද රථය නවතා තිබූ කඩය අසලට පැමිණ පසුව ත්‍රිරෝද රථයේ නංවාගෙන පොලිස් ස්ථානයට ගෙන ආ බවත් දක්වා ඇත.

විමර්ශනය :-

පැමිණිලිකරු කොමිෂන් සභාව හමුවේ දක්වා ඇත්තේ, පෙර සිදුවූ සිදුවීමකට පළිගැනීමක් ලෙස ව්‍යාජ චෝදනාවකට අත්තෝමතිකව තමා අත්අඩංගුවට ගෙන පහර දුන් බවයි.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය දක්වා ඇත්තේ, පරිසර නඩු ලබා ගැනීම සඳහා ගිය විට පැමිණිලිකරුගේ මව පරිසරය අපිරිසිදු වන ලෙස සිදුකළ කටයුත්තක් පිළිබඳව දක්වා ප්‍රකාශයක් ගැනීමේදී පැමිණිලිකරු හා ඔහුගේ මව බැණවැදී, තර්ජණය කර එළියට ගිය බවත්, ඔහුගේ තර්ජණය පිළිබඳ සැක සිති කැෂියර් ලාච්චුව පරීක්ෂා කිරිමේදී පුපුරන අත්බෝම්බයක් තිබීම මත පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවත්ය.

දෙපාර්ශවයේ කරුණු දැක්වීම අනුව වගඋත්තරකාර පාර්ශවය පාරට කුණු දමා තිබීම මත එතනට පැමිණි බව නිරීක්ෂණය වේ. එහිදි පැමිණිලිකරු දක්වා ඇත්තේ ඒ පිළිබඳව පැහැදිලි කිරීමේදී එය පිළිනොගැනීම නිසා ඔවුන් තමන් අත්අඩංගුවට ගත් බවයි. නමුත් වගඋත්තර පාර්ශවයට අනුව තර්ජණය කිරීම නිසා සැක සිති ලාච්චුව බැලීමේදී අත්බෝම්බයක් තිබීම මත අත්අඩංගුවට ගත් බවට කරුණු දක්වා ඇත. නමුත් අධිකරණයට ඉදිරිපත් කළ බී වාර්තාවේ සඳහන් කර ඇත්තේ, නිසි පරිදි ප්‍රකාශ කරනු ලබන ආඥාවකට අවනත නොවීම, රජයේ සේවකයෙකුට පාඩු කිරීමේ තර්ජණය, ප්‍රකාශයට අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම, පිපිරෙන ද්‍රව්‍යක් පිළිබඳව නොසැලිකිලිමත්ව කටයුතු කිරීම යන වැරදි සම්බන්ධව වන. බව අදාළ ලේඛන පරීක්ෂාවේදී නිරීක්ෂණය වී ඇත.

එහිදී පැමිණිලිකරු සම්බන්ධව අධිකරණයේ වූ ඉහත නඩුව නීතිපති උපදෙස් මත නීතිය මඟින් කටයුතු නොකිරීම නිසා කොමිෂන් සභාවේ පැමිණිලිකරු නිදහස් කර ඇත.

මෙහිදී පැමිණිලිකරු සැකකරු වූ කරුණු පිළිබඳ ප්‍රශ්න ගත වනුයේ ප්‍රකාශයට අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම සිදුකරනු ලැබුවේ සැකකරුගේ මව වුවද පැමිණිලිකරු ඒ සඳහා වගඋත්තරකරු කර තිබීමත්, පැමිණිලිකරුගේ මව පාරට කුණු දැමීමට අදාළ පාරිසරික තොරතුරට කිසිදු නීතිමය කටයුත්තක් නොකිරීමත් යන කාරණය නිසාය. ඒ අනුව මෙහිදී පැමිණිලිකරුගේ මව සම්බන්ධයෙන් නීතිමය කටයුතු කළ යුතුව තිබුනද වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවේ පැමිණිලිකරු පමණක් අධිකරණයට ඉදිරිපත් කිරීම තුළින් පැමිණිලිකරු කෙරේ ද්වේශසහගතව කටයුතු කළාද යන සැකය පැන නඟී.

එසේම පිපිරෙන ද්‍රව්‍යක් පිළිබඳව නොසැලකිලිමත්ව කටයුතු කිරීමද බී වාර්තාවේ දක්වා ඇත. මෙහිදී වගඋත්තරකාර පාර්ශවය දක්වා ඇත්තේ, පැමිණිලිකරුගේ තර්ජණය කිරීම නිසා පැමිණිලිකරු පිළිබඳව සැකසිතී ලාච්චුව පරීක්ෂා කිරීමේදි එහි අත්බෝම්බයක් තිබූ බවයි.

නමුත් වගඋත්තරකරුවන්ගේ විභාග සටහන් පරීක්ෂා කිරීමේදී තර්ජණය කර ඇත්තේ "කැමති ආකාරයට නඩු පවරන ලෙසට හා තමා කිසිවෙකුට බය නැති බවත් දක්වමින් බව" නිරීක්ෂණය වේ. එසේම උ.පො.ප චන්දිමගේ සටහන් පාරිසරික තොරතුරු පොතේ 151/05 යටතේ දක්වා ඇත්තේ "ඔහු කැෂියර් මේසය අසලින් ඉවත්ව මා අසලට පැමිණ මාගේ ඇගේද හැපෙමින් ඉදිරිපස තිබූ පැනි බීම ඇසුරුමකින් පැනි බීම බෝතලයක් ගෙන වෙළඳසැල තුළ බිම ගසා උඹලාට ඕන දෙයක් කරපන් කියා තර්ජනය කරමින් පාරට දුවනවා දැක්කා" යනුවෙනි.

ඒ අනුව පැමිණිලිකරු කිසිදු විටක බෝම්බයක් පිළිබඳව තර්ජණය නොකළ බැවින් හා ඔහුට අවශ්‍යතාවය තිබුනේ නම් එය උපයෝගි කොට ගෙන තර්ජණය කිරීමට හැකියාව තිබුනු බව නිරීක්ෂණය වේ.

එසේම වගඋත්තරකරුට සාධාරණ සැකයක් පැමිණ ලාච්චුව පරීක්ෂා කිරීමට තරම් වූ කරුණක් ඉදිරිපත්ව ඇති කරුණු අනුව නිරීක්ෂණය වී නොමැත. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් අත්බෝම්බය නිර්මාණය කරන ලද "වරදක්" බවට තවදුරටත් නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම කිසිදු විමර්ශනයකින් තොරව සාධාරණ හේතුවකට සිදුකල අත්අඩංගුවට ගැනීමක් නොවන බව සනාථ වේ.

මීලඟට පැමිණිලිකරු දක්වා ඇත්තේ අත්අඩංගුවට ගෙන තමාට පහර දුන් වගත් 1 වන වගඋත්තරකරු පෙර පලිගැනීමක් ලෙස මෙම ක්‍රියාවන් කළ බවත්ය.

මෙහිදී එම කාල වකවානුවේ 1 වන වගඋත්තරකරු ස්ථානයේ නොසිටි බවට හා පුහුණුවක් සඳහා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සිටි බවට ලේඛන ඉදිරිපත් කරන අතරම ඒ බව පොලිස් ස්ථානාධිපති අදාළ ලේඛන බලා සහතික කර කොමිසමට දන්වා ඇත. පැමිණිලිකරු විසින්ද 01 වන වගඋත්තරකරු සිටි බවට දැක්වීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොමැත.

පැමිණිලිකරුට වධහිංසාවට ලක් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමේදී පැමිණිලිකරු තමාට අමානුෂික ලෙස වගඋත්තරකරුවන් පහරදුන් බවට දක්වා තිබුනද පහර දුන් ආකාරය කිසිදු විටක සඳහන් කර නොමැත.

පැමිණිලිකරු අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කිරීමේදී රෝගී ඉතිහාසය ලෙස පහරදුන් ආකාරය දක්වා ඇත්තේ "පොලිසිය විසින් වම් පස මුහුණට හා කණට පහර දුන් බවයි" 'Assaulted by Police to left Side of face and to left ear'

නමුත් තුවාල ස්වභාවය පිළිබඳ අධිකරණ වෛද්‍ය වරයා විසින් යොදා ඇති සටහනේ ඇත්තේ මුහුණේ දකුණු පස නිකට ආසන්නයේ 1 cm එක් සීරිමක් තිබෙන බවයි. එය මොට ආයුධයකින් වූ තුවාලයක් බවද දක්වා ඇත.

මෙහිදී පැමිණිලිකරු සඳහන් කර ඇති පරිදි පහරදීම සිදුකරන ලද්දේ වම් පස වුවද තුවාලය ඇත්තේ දකුණු පසය. ඒ අනුව පැමිණිලිකරු දක්වන පහරදුන් ආකාරය හා තුවාල සැසඳීමක් සිදුනොවන අතර, වධහිංසාව සම්බන්ධව ප්‍රබල සාක්ෂියක් වූ වෛද්‍ය වාර්තාව මෙහිදී වධහිංසාවට සාක්ෂි දීමක් සිදු නොකරයි.

එසේම පැමිණිලිකරු සිය පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඇසින් දුටු සාක්ෂි දිවුරුම් ප්‍රකාශ සැලකීමේදී දිවුරුම් ප්‍රකාශ 4 ක් ලබාදී ඇති අතර, එහිදී දක්වා ඇත්තේ පැමිණිලිකරුගේ මව සමඟ වගඋත්තරකරුවන් වචන හුවමාරුවක් සිදුවූ බවයි. නමුත් පහරදීමක් පිළිබඳ සඳහනක් එහි දක්වා නොමැත. එසේම පැමිණිලිකරු ජීප් රියේ නංවාගෙන ගිය බවද දක්වා ඇත. දිවුරුම් ප්‍රකාශ 4 ට එකම ආකාරයට එකම වාක්‍ය කාණ්ඩවලින් යුක්ත දිවුරුම් ප්‍රකාශ ලෙස ලබාදීම මත එහි සත්‍යතාව හා පිළිගැනීම පිළිබඳ ගැටලුවක් මතුවේ.

එබැවින් වධහිංසාව සම්බන්ධව තහවුරු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු දැක්වීමක් සිදු නොවීම මත වධහිංසාවක් සිදුවූ බවට දක්වන කරුණු බැහැර කරනු ලැබේ.

නමුත් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීති විරෝධීව සිදුකර ඇති බවට ඉදිරිපත්ව ඇති සමස්ථ කරුණු දෙස අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වන බැවින්, එමඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

01. 2, 3, 4, 5 වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත රු. 10,000/- බැගින් වූ මුදලක් ගෙවිය යුතුය.

02. අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2018.04.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.